www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ දෙමල රැඳවියන් නිදහස් කරන ලෙස බල කරනු

## Demand the release of Tamil detainees in Sri Lanka

සමාජවාදී සමානතා පක්ෂය විසිනි

2009 ඔක්තෝබර් 07

මැයි මාසයේ එල්ටීටීඊ ලත් පරාජයත් සමඟ, දැවැන්ත රැඳවුම් කඳවුරු තුල කොටුකර සිටින 250,000 කට වැඩි දෙමල සිවිල් වැසියන් වහාම හා කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස බලකරන ජාත්‍යන්තර උද්ඝෝෂනයක්, සමාජවාදී සමානතා පක්ෂය සමඟ එක්ව ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් දියත් කර තිබේ.

ආන්ඩුව හිරිකිතයකින් තොරව මෙම සිර කඳවුරු " සහන ගම්මාන" ලෙස ප්‍රකාශ කරයි. කෙසේ වුවත්, කටු කම්බි වැටවලින් වටකල හා දැඩි ලෙස සන්නද්ධ කල හමුදා භටයන් විසින් රැකවල් ලා ඇති මෙම කඳවුරු තුලට ඇතුල් වීමට හෝ ඉන් පිටවීමට කිසිදු රැ ඳවියෙකුට අවසර දෙනු නොලැබේ. රැඳවියන්ගේ නෑදෑ හිතවතුන්ට ඔවුන් බැලීමට අවසර ලැබෙන්නේ, අධි ආරක්ෂිත සිර කඳවුරු තුල පමනක් දක්නට ලැබෙන ආකාරයේ දැඩි සෝදිසියකින් හා ඡායාරූපගත කිරීම් වලින් පසුව පමනකි.

රඳවා ඇති තරුන හා මහලු පිරිමින් හා ගැහැනුන්, හුදෙක් එල්ටීටීඊ ග්‍රහනයේ පැවති ප්‍රදේශ තුල ජීවත්වූ, කඳවුරු තුලට ගාල් කරන ලද, සිවිල් වැසියන්ය. ඔවුහු ඒ වන විටත්, මාස ගනනාවක මිලිටරිමය කොටුකිරීමේ තත්ත්වය හමුවේ, සාගින්දරෙන් ද විජලනයෙන් ද තුවාල වලින් හා රෝගාබාධ වලින් ද පීඩාවට පත්ව සිටියි. හමුදාවේ ඉවක් බවක් නැති ෂෙල් වෙඩි ප්‍රහාර වල ප්‍රතිපලයක් ලෙස බොහෝ දෙනෙකුට සිය පවුල් හා හිතවතුන් අහිමිවී ඇත.

කඳවුරු තුල ඇත්තේ බෙහෙවින් සිත් කම්පා කරවන තත්ත්වයකි. අප්‍රමානවත් ආහාර, සනීපාරක්ෂක හා වෛද්‍ය පහසුකම් ද, ජල හිඟය මෙන්ම නිදාගැනීමේ ඉඩ කඩ නොමැති කම ද ඒවා තුල දක්නට ලැබෙයි. ඊට අමතරව, කඳවුරු වල අධිකාරිත්වය දරන මිලිටරිය, බියගැන්වීමේ හා ත්‍රස්තයේ පාලනයක් ඒවා අභ්‍යන්තරයෙහි පවත්වාගෙන යයි. දැඩි මාධ්‍ය වාරනයක තතු තුල පවා, කාන්තාවන්ට සිදුකෙරෙන ලිංගික අපචාර, විරෝධය පාන සිරකරුවන්ට වෙඩි තැබීම හා "අතුරුදහන්කිරීම" පිළිබඳ තොරතුරු ඒවා තුලින් නිකුත් වෙයි. මිලිටරි බුද්ධි අංශ සාමාජිකයන් විසින්, තරුන පිරිමින් හා ගැහැනුන් ක්‍රමානුකූලව ප්‍රශ්න කිරීමට ලක් කරයි. "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස හංවඩු ගැසූ 10,000 කට වැඩි පිරිසක්, අපචාරය හා වධ හිංසා පැමිනවීම පිළිබඳව කුප්‍රකට "පුනරුත්ථාපන" කඳවුරු තුලට අද දමා තිබේ.

"ත්‍රස්තවාදීන්" මුලිනුපුටා දැමීම සඳහා බලහත්කාරයෙන් රඳවා තැබීම අවශ්‍ය බව ජනාධිපති මහින්ද රාජපක්ෂ දැඩි ලෙස කියා සිටිය ද, රැඳවුම් කඳවුරුවල හෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සිටින කිසිවෙකුටත් මොනම අපරාධයක් සම්බන්ධයෙන් හෝ දඬුවම් පමුනුවා නැතුවා පමනක් නොව, චෝදනා ඉදිරිපත් කර වත් නැත. යථාර්තය නම්, මිලියන කාලක් තරම් ජනතාවක් දෙමල වීම නිසා පමනක්, සමූහ ලෙස ඔවුන්ට දඬුවම් පැමිනවීමේ ක්‍රියාදාමයක ආන්ඩුව නියැලී සිටින බවයි. ඒ අතරම, ඔවුන් යුද සිරකරුවන් ලෙස සලකා කටයුතු කිරීම, රටේ ව්‍යවස්ථාව හා නීතිය ම අමු අමුවේ උල්ලංඝනය කිරීමකි.

1983 වසරේ පටන් පැවත ආ සියලු ආන්ඩු විසින් පවත්වාගෙන ගිය යුද්ධයේ වාර්ගික ස්වභාවය, රැඳවුම් කඳවුරු වලින් මොනවට හෙලිදරව් කරයි. මෙය, තමන්ගේ දෙමල සහකරුවන්ගේත්, සියලු වැඩකරන ජනතාවන්ගේත් වියදමෙන් දිවයිනේ සිංහල ප්‍රභූ පැලැන්තියේ වරප්‍රසාදිත තත්ත්වය සුරක්ෂිත කර ගැනීමේ අරමුන මුල්කොටගත් ගැටුමක් මිස, ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක් නොවේ. කම්කරු පන්තිය බෙදා වෙන්කිරීම සිය පන්ති පාලනය රැකගැනීමේ ප්‍රධාන මුක්කුව කොට ගත් කොලඹ දේශපාලන සංස්ථාපිතය විසින්, 1948 නිදහස ලැබූ තැන් පටන් දශක ගනනාවක් තිස්සේ නිල වශයෙන් පවත්වාගෙන ගිය දෙමල විරෝධී වෙනස්කම් කිරීම තුල, එහි මූලයන් රැඳී තිබේ.

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ඓතිහාසික පූර්වාදර්ශයන් කිහිපයකට උරුමකම් කියයි. බෝයර්වරු සිරගත කිරීමේ රැඳවුම් කඳවුරු පිලිබඳ කප්පිත්තන්වූ බ්‍රිතාන්‍යයේ 1899-1902 බෝයර් යුද්ධය හෝ දෙවන ලෝක යුද්ධ අවධියේ

එක්සත් ජනපදය විසින් ජපාන-ඇමරිකානුවන් සිරගත කිරීම තෙක් අපස්සට යාමට යමෙකුට බල කෙරෙයි. කෙසේ වෙතත්, සමස්ත ජනකායක්ම ක්‍රමානුකූලව වධ බන්ධනයට ලක් කිරීමේ නියම පූර්වාදර්ශය සැපයෙන්නේ, දෙවන ලෝක සංග්‍රාම අවධියේ යුදෙව්වන් මිලියන ගනනක් මෙන්ම, වෘත්තීය සමිති සාමාජිකයන් ද සමාජවාදීන් හා කොමියුනිස්ට්වාදීන් ගාල් කරන ලද නාසි රැඳවුම් කඳවුරු වලිනි. ඒවායේ සිරකරුවන් බෙහොමයක් මරාදමනු ලැබිනි.

රාජපක්ෂ තන්ත්‍රය එන්ට එන්ටම ක්‍රියාත්මක වන්නේ ව්‍යවස්ථාව, නීති පද්ධතිය හා අධිකරනය එලිපිටම හැල්ලුවට ලක් කරන දේශපාලන-මිලිටරි කල්ලියක් ලෙසය. ජනාධිපති, ඔහුගේ සොහෙයුරන්, කිට්ටු උපදේශකයන් හා හමුදා නායකයන් විසින් ගනු ලබන තීන්දු වලට රබර් මුද්‍රාව තබන, බල රහිත සංස්ථාවක් බවට, පාර්ලිමේන්තුව පත්ව තිබේ. යුද්ධය පැවති වසර විසිපහක කාලය තුල ගොඩනගන ලද හා රාජපක්ෂ යටතේ ශක්තිමත් කරන ලද පොලිස් රාජ්‍ය යාන්ත්‍රනය, එලෙසම පවතියි. යුද්ධයෙන් ඉක්බිත්තෙහි හමුදාව විසුරුවා හැරීම කෙසේ වෙතත් ආන්ඩුව, හමුදා ශක්තිය තරකරමින් උතුරු නැගෙනහිර දැවැන්ත මිලිටරි කඳවුරක් බවට පරිවර්තනය කරමින් සිටියි.

යුද වියදම් ගෙවීමට හිලව් වශයෙන් රට මුලුමනින්ම උකසට තබා ඇති රාජපක්ෂ, ගෝලීය පසුබෑමෙන් උත්සන්න කෙරුනු බරපතල ආර්ථික අර්බුදයකට මුහුන දී සිටියි. අලුතින් එකතු වන ඉමහත් ආර්ථික බර, කම්කරු පන්තිය හා දුගීන් මත පැටවීම අරමුනු කරගත්, නව " ආර්ථික යුද්ධයක්" ඔහු දැනටමත් ප්‍රකාශයට පත්කොට ඇත. දෙමල සුලුතරය, ආන්ඩුවට ගැති සාතක කල්ලි විසින් අත්තනෝමතිකව රඳවා තැබීම, " අතුරුදහන්කිරීම" හා මරාදැමීම සඳහා යොදාගනු ලැබූ එම ක්‍රමවේදයන්ම, දැන් සියලු වැඩකරන ජනතාවගේ විරෝධය මැඩීම සඳහා ද යොදාගනු ඇති බවට සසප අනතුරු අඟවා සිටියි.

දෙමල රැඳවියන් නිදහස් කිරීම සඳහා ගෙනයන ව්‍යාපාරය වනාහි, සමස්තයක් ලෙස කම්කරු පන්තියේම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්ත්වයන් රැකගැනීමේ පුලුල් අරගලයක අත්‍යවශ්‍ය උපාංගයකි. සිර කඳවුරු වසා දැමීම , උතුරු නැගෙනහිර මිලිටරි ග්‍රහනය අවසන් කිරීම හා සියලු හමුදා ඉවත් කිරීමත් සමඟ අතිනත ගෙන යා යුතුය. මෙම අරගලයේදී, විවිධාකාර විරුද්ධ පක්ෂ හෝ "ජාත්‍යන්තර ප්‍රජාව" මත කිසිදු විශ්වාසයක් තැබිය නොහැකිය.

මහා පරිමානයෙන් දෙමල වැසියන් රඳවා තැබීම කෙරෙහි කිසිදු විරුද්ධ පක්ෂයක් අභියෝග කර නැත. ඒ වෙනුවට, දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ, ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් "නීත්‍යානුකූල" කිරීම සඳහා මහජන ආරක්ෂක පනත යටතේ අලුතෙන් කුරිරු රෙගුලාසි පැනවීමට සහාය පලකොට තිබේ. රැඳවියන් මුහුනපා ඇති ගැටලු වලට විසඳුම් සෙවීම සඳහා සර්ව පාක්ෂික කමිටුවක් පිහිටුවන ලෙස ජනාධිපතිගෙන් ඉල්ලීම තිබියදී ම, සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන, රැඳවුම් කඳවුරු වලට ප්‍රසිද්ධියේම සහයෝගය දැක්වීමෙන් සිය රාජකාරිය ඉටුකර තිබේ.

එල්ටීටීඊ හොරනෑවක් ලෙස ක්‍රියාකල දෙමල ධනපති පක්ෂවල සභාගයක් වන දෙමල ජාතික සංධානය (ටීඑන්ඒ), රැඳවියන් වහාම නිදහස් කරන ලෙස ඉල්ලා නැත. පසුගිය සතියේ රාජපක්ෂ සමඟ පැවැත්වූ රැස්වීමකින් පසුව ටීඑන්ඒ නායක සම්බන්ධන් ප්‍රකාශ කලේ, "රටතුල අවතැන්වූවන් මුහුනපාන ගැටලු විසඳීමටත් ඔවුන් කඩිනමින් යලි පදිංචි කිරීම සඳහා පහසුකම් සැපයීමටත්" සිය පක්ෂය "ආන්ඩුව සමඟ එක්ව කටයුතු කරනු ඇති" බවයි.

එල්ටීටීඊ ය මත්, දෙමල ජනතාව නිදහස් කිරීම සඳහා කිසිදු උද්ඝෝෂනයක් දියත් කොට ඇත්තේ නැත. පිටුවහලේ ඇති එහි ඊනියා අන්තර්ජාතික ආන්ඩුව, එහි නායකයා රඳවා තැබීම පිලිබඳව අගෝස්තු මාසයේ නිකුත් කල නිවේදනයකින් ඉල්ලා සිටියේ, "ජාත්‍යන්තර ප්‍රජාව, ලක්ෂ තුනක සිවිල් වැසියන්ගේ දුක් ගැනවිලි වලට කඩිනම් විසඳුමක් සඳහා මෙන්ම, පත්මනාදන් මහතාට සියලු ජාත්‍යන්තර පිලිගැනීම් වලට අනුව ආරක්ෂාව ලැබීම ගැන වගබලාගත යුතු" බවටයි.

නව සමසමාජ පක්ෂය (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂය (යූඑස්පී) වැනි මධ්‍යම පන්තික පැරනි වාම කන්ඩායම් ගැන සලකන කල ඒවා ද, "ජාත්‍යන්තර ප්‍රජාව" රැඳවියන් ගලවා ගැනීමට මැදිහත් විය යුතුය යන මිත්‍යාව තොරොම්බල් තරති. යූඑස්පී ය ප්‍රධාන බලවතුන්ගෙන් ඉල්ලා සිටියේ, රැඳවියන් නිදහස් කරන ලෙස රාජපක්ෂ ආන්ඩුවට බල කෙරෙන පරිදි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නයට පොල්ලක් දමන ලෙසයි. නසසප, ආන්ඩුවේ මානව හිමිකම් වාර්තාව ගැන සුලුවෙන් කෙරෙන විවේචන කරන කොටගෙන එක්සත් ජනපදයට හා යුරෝපීය බලවතුන්ට, ඔහේ හුරේ දැමීය.

යථාර්තයේදී, රාජපක්ෂ නැවත පටන්ගත් වාර්ගික යුද්ධයට නිහඬව සහාය දුන් ආකාරයටම මහා බලවතුන්, ආන්ඩුවේ සිර කඳවුරු වලට ද අනුමැතිය පලකරයි. කඳවුරු තුලට පිවිසීමේ "වැඩි ඉඩකඩ" හා "යලි පදිංචිය කඩිනම් කිරීම" පිලිබඳ එහි සියලු ඉල්ලීම් තිබියදී ද, කඳවුරු පවත්වාගෙන යාමේ වියදම් වලට කරගැසීම මගින් එක්සත් ජාතීන්, දෙමල සිවිල් ජනතාව සිරගත කිරීමට සෘජුව ම වගකිව යුතුය. කඳවුරු පවත්වාගෙන යාම සඳහා මේ දක්වා එය ඩොලර් මිලියන 130 ක් ලබාදී තිබේ.

එලෙසම, එක්සත් ජනපදය හා යුරෝපීය බලවතුන් විසින් කරන සීමිත විවේචන, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිලිබඳ කිසිදු අව්‍යාජ උත්සුකයන් නිසා කෙරෙන්නක් නොවේ. එක්සත් ජනපදය, ජාමූඅ නය ප්‍රමාද කල ද අවසානයේ එය අනුමත වීමට ඉඩ හැරියේය. ශ්‍රී ලංකාවේ මානව අයිතීන් පිලිබඳ එහි කුහක උත්සුකයන්, හුදෙක් කොලඹ ආන්ඩුව මත පීඩනය යෙදීමේ මෙන්ම, රටතුල සිය පිලිමලුන්ගේ, විශේෂයෙන්ම චීනයේ බලපෑමට, හරස් කැපීමේ මාධ්‍යයන් පමනි.

ඉන්දියාව, චීනය හා රුසියාව සම්බන්ධයෙන් ගත්කල, දෙමල ජනතාව කෙරෙහි ඔවුන්ගේ පිලිකුල නාටකාකාර ලෙස ප්‍රදර්ශනය වූයේ, මැයි මාසයේ පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මන්ඩලයේ රැස්වීමක දී ඔවුන් ඉදිරිපත් කල යෝජනාවකින්, ශ්‍රී ලංකා ආන්ඩුවේ සාපරාධී යුද්ධයෙන් එය ලත් ජයග්‍රහනය හුවාදැක්වූ අවස්ථාවේ ය.

අනෙක් සෑම ප්‍රශ්නයක දී මෙන්ම මෙහිදී ද, නසසප හා යූඑස්පී "ජාත්‍යන්තර ප්‍රජාවට" කරන කන්නලව්ව ගලා එන්නේ, දෙමල ජනතාවගේත් සමස්ත කම්කරු පන්තියේත් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් වෙනුවෙන් අව්‍යාජ අරගලයක් ගෙනයාමේ හැකියාව ඇති එකම සමාජ බලවේගය වන කම්කරු පන්තියේ, කුමන හෝ ස්වාධීන බලමුලුගැන්වීමක් කෙරෙහි ඔවුන් දක්වන සතුරුකමෙනි.

සියලු කම්කරුවන්ට සමාජවාදී සමානතා පක්ෂය කියා සිටින්නේ, දෙමල රැඳවියන් නිදහස් කරන ලෙසටත්, කඩකප්පල්වූ ඔවුන්ගේ ජීවිත යලි ගොඩනගා ගැනීම පිනිස රුපියල් බිලියන ගනනින් මුදල් වැයකර ඔවුන්ට සහන සලසන ලෙසටත් බලකල යුතු බවය. විශේෂයෙන්ම සිංහල කම්කරුවන් සිය දෙමල සහෝදර සහෝදරියන්ට සෘජුවම ආධාර කිරීමට ඉදිරිපත් විය යුතුය. එම උද්ඝෝෂනය පදනම් කල යුත්තේ, අධිරාජ්‍යවාදී බලවතුන්ට හා එක්සත් ජාතීන්ගේ මන්ඩලය නමැති මැරවරයන්ගේ ගුබ්බෑයම වෙත වැදගැම්මකට නැති කන්නලව් කිරීම මත නොව, දකුනු ආසියාවේ ද ලෝකය පුරා ද විසිර සිටින කම්කරුවන් වෙතට හැරීම මතය.

ශ්‍රී ලංකාවේ වැඩකරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම, සෑම රටකම කම්කරු පන්තියේ වගකීමකි. රාජපක්ෂ ආන්ඩුවේ කටයුතු, ජාත්‍යන්තර ක්‍රියවලීන්ගේ සුවිශේෂ තියුනු ප්‍රකාශනයක් පමනි. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" බැනරය යටතේ, පෙරමුනේම සිටින එක්සත් ජනපදය ද සමඟ ලොව පුරාම ආන්ඩු, විදේශයන්හි අලුත් යුද්ධ සඳහා සූදානම් වෙමින් සිටින හා සිය රටවල් තුල ගැඹුරු වන පන්ති ගටුම් වලට මුහුන දී සිටින තතු හමුවේ, දිගු කාලක් තිස්සේ පැවති නීතිමය සම්මතයන් ඉරා දමමින් සිටිති. ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම, යල්පැනගිය ධනේශ්වර පර්යායට එරෙහිව හා සමාජවාදී ආකාරයකට සමාජය මුලුමනින්ම ප්‍රතිසංවිධානය කිරීම සඳහා වූ අරගලයක් සමඟ අවියෝජනීය ලෙස බැඳී තිබේ.

කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම පිලිබඳව උනන්දුවක් දක්වන සියල්ලන් ගෙන් සසප ඉල්ලා සිටින්නේ, ලිපි එවමින් ද රැස්වීම් පවත්වමින් ද ශ්‍රී ලංකා ආන්ඩුව හෙලාදකිමින්, සියලු දෙමල රැඳවියන් වහාම හා කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙසට බල කරන විරෝධතා සංවිධානය කරමින් ද අපගේ උද්ඝෝෂනයට සහාය දෙන ලෙසයි.

© www.wsws.org